**<u>මීගමුව මහා නගර සභාව මගින් නත්තල් උත්සව සමයේ මීගමුව නගරය තුළ තාවකාලික වෙළඳ කුටි ඉදිකිරිම සඳහා ප්‍රාදේශීය මිල ගණන් කැඳවීම.</u>**

මීගමුව මහා නගර සභාවට අයත් පහත සඳහන් මාර්ගවල ඉඩපහසුකම් ඇති ස්ථානයන් හී, නත්තල් උත්සව සමය තුළ (2025.12.05 සිට 2025.01.04 දක්වා) වෙළඳ කුටි ඉදිකිරිමට අවසර ලබාදීම සඳහා ඒ පිළිබඳ උනන්දුවක් ඇති වෙළඳ ආයතන / පුද්ගලයන් වෙතින් ප්‍රදේශිය මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | බදුකරය | අවම මුදල | අයදුම්පත් ගාස්තුව (ආපසු නොගෙවන) | කඩ ගණන | කඩ කුටියක ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 1 | ග්‍රීන් පාර්ක් පිටියේ ඉදිරිපිට කුටි | රු 40000.00 | රු 5000.00 | 15 | (10x10) |
| 2 | දුම්රියපල අසළ සිට ලංකා බැංකුව සහ රීගල් ඉඩම ඉදිරිපිට ලාෆ් සුපර් මාර්කට් දක්වා | රු 100000.00<br>රු 50000.00 | රු 5000.00 | 25<br>01 | (10x10)<br>(05x10) |
| 3 | මහජන බැංකුව ATM යන්ත්‍රයේ සිට බෝක්කුව දක්වා කොටස සහ IOC ෂෙඩ් එක ඉදිරිපිට | රු 60000.00 | රු 5000.00 | 01<br>06 | (06 x10) |
| 4 | මීගමුව බස් නැවතුම්පලට පිවිසෙන අභරදගුරු නිකලස් මාර්කස් මාවතෙහි දුම්රිය පාරට සමාන්තරව කැල්ටන් හෝටලය ඉදිරිපිට හා සතොස ඉදිරිපිට ස්ථාන | රු 30000.00 | රු 5000.00 | 12 | (10x06) |

- ❖ අයදුම්පත් නිකුත් කිරීම. - 2025.11.11 දින සිට 2025.11.19 දින ප.ව. 3.00 දක්වා

  (මීගමුව මහා නගර සභාවේ ගණකාධිකාරී දෙපාර්තමේන්තුවෙන්)

- ❖ අයදුම්පත් භාර ගැනීම. - 2025.11.20 දින පෙ.ව. 10.00 දක්වා

  (එම වේලාවෙන් පසු ඉදිරිපත් කරනු ලබන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

- ❖ අයදුම්පත් විවෘත කිරීම. - 2025.11.20 දින පෙ.ව. 10.05 ට

නාගරික කොමසාරිස්

මහා නගර සභාව

මීගමුව.

මීගමුව නගර සභා කාර්යාලයේ දී

2025..11..11..... දින

**කොන්දේසි**

01. අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ ආකෘති පත්‍ර ගාස්තු ගෙවීමෙන් පසුව වේ.

02. අයදුම්පත්‍රය සමඟ නිකුත් කරනු ලබන කොන්දේසිවලට එකඟව ඔබ විසින් මිළ ගණන් සමඟ ඉදිරිපත් කළ යුතුය.

03. ප්‍රසම්පාදන අයදුම්පත් ලබා ගැනීමේ දී ඉල්ලුම්කරු තම අනන්‍යතාවය තහවුරු කර අයදුම්පත් ලබා ගත යුතු අතර, ලංසු ඉදිරිපත් කළ යුත්තේ ද ඉල්ලුම්කරුම වේ.

04. අයදුම්පත් ලබා ගන්නා ඉල්ලුම්කරුම ලංසු ඉදිරිපත් නොකර වෙනත් අයකු ලංසු ඉදිරිපත් කළ අවස්ථාවක දී එම ලංසු අයදුම්පත්‍රය අවලංගු පෝරමයක් ලෙස සලකනු ලැබේ.

05. මිල ගණන් ඉදිරිපත් කළ හැක්කේ ශ්‍රී ලංකීය පුරවැසියන්ට පමණි.

06. අයදුම්පත්‍රයේ මිල ගණන් අකුරින් හා ඉලක්කමෙන් නිවැරදිව හා පැහැදිලිව සඳහන් කළ යුතුය. පසුව මිල ගණන් වෙනස් කරන්නේ නම් තනි ඉරකින් කපා අයදුම්පතෙහි අත්සන් කර සහතික කර තිබිය යුතුය. වෙනස් කරන ලද මිල ගණන් ද නිවැරදිව පැහැදිලි අකුරෙන් හා ඉලක්කමෙන් ලියා තිබිය යුතුය. එසේ නොවන්නේ නම් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. ඔබ විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී සභාවෙන් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර මුල් පිටපත හා දෙවන පිටපත වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා එම කවරයේ වම් පස ඉහළ කෙළවරේ මිල ගණන් ඉදිරිපත් කරන බදුකරයේ නම සඳහන් කර නාගරික කොමසාරිස් , මහා නගර සභාව,මීගමුව යන ලිපිනයට 2025.11.20 දින පෙ.ව10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. වැඩි විස්තර නාගරික ගණකාධිකාරී දුරකථන අංක **0312281938** මගින් දැනගත හැකිය.

08. අයදුම්පත් විවෘත කරන අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ ලිඛිත අවසරය ඇති එක් අයෙකු සහභාගී විය හැකිය.

09. කිසිදු සාධාරණ හේතුවකින් තොරව ජයග්‍රාහකයා විසින් මිල ගණන් ප්‍රතික්ෂේප කළහොත්, මිළහට වැඩිම ලංසුව ඉදිරිපත් කර ඇති ජයග්‍රාහකයා වෙත ඉඩපහසුකම ලබා දෙනු ලැබේ. ජයග්‍රාහකයා මිල ගණන් ඉදිරිපත් කරන කඩ කුටි සඳහා වෙන වෙනම එකඟ වූ මුදල 2025.12.02 දින ප.ව. 2.30 ට පෙර ගෙවා නිම කල යුතුය.

10. ජයග්‍රාහකයා විසින් මෙම ලබා ගන්නා ස්ථානයේ වෙළඳාම් කටයුතු කළ යුතු අතර, වෙනත් අයෙකුට මෙම ස්ථානය විකිණීම හෝ බදුදීම නොකළ යුතුය.

11. එක් කුටියකට එක් පුද්ගලයෙකුට අයදුම්කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

12. මෙම මිළ ගණන් සම්බන්ධයෙන් අවසාන තීරණය මීගමුව මහා නගර සභාව සතු වේ.

නාගරික කොමසාරිස්
මහා නගර සභාව
මීගමුව.
මීගමුව නගර සභා කාර්යාලයේ දී 2025 ..11.11....... දින